# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/21 - 2019 ජනවාරි මස 01 වැනි අඟහරුවාදා - 2019.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* KDS/KGK/4/9/2017/01/LA.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/11/2016/UD/521.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවටකෝරළේ සුළු කොට්ඨාසයේ, කටුකැලේ වසම (255) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බහිරවකන්ද කොට්ඨාස අංක 18- කටුකැලේ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2018.12.10 දිනැති මූලික පිඹුරු අංක මහ 6891 හි කැබලි අංක 01, 02 සහ 04 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0155 ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වරිපනම් අංක 187, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: පී. එච්. ආර්. පී. ජිනසේන, අංක 47, ශ්‍රී ධම්මසිද්ධි මාවත, අස්ගිරිය, මහනුවර; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0115.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: වරිපනම් අංක 274/4, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සී. කේ. ජේ. එස්. කරුණාරත්න සහ තවත් අය, අංක 274/4, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත, මහනුවර; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0037.

03. **කැබලි අංක 04**

ඉඩමේ නම: –; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ

ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.02.20 වැනි දින පෙ. ව. 10.00 ට මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019.02.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2018 දෙසැම්බර් මස 27 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

01 - 330

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.